පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 09 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය : චිත්‍ර කලාව I ,

පාසලේ නම : ....................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

**කාලය පැය 01 යි**

❖ **සියලුම ප්‍රශ්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. මෙහි දැක්වෙන කලා නිර්මාණය ........................................................................................................ නමින් හඳුන්වයි.

2. මෙය ........................................................................................................................ යුගයට අයත් වේ.

3. මෙම කලාත්මක අතින් උසස් නිර්මාණය ................................................................................................ දක්නට ලැබේ.

4. මෙහි ඇති කැටයම් ........................................................................................................ ශිල්ප ක්‍රමයට නෙලා ඇත.

5. සෙනරත් පරණවිතාන මහතාගේ ප්‍රකාශයට අනුව සංකීර්ණ ලියවැලෙන් .................................................. සංකේතවත් වේ.

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

6. හින්දු ඉතිහාසයේ සංග යුගයේ සිට දැව කැටයම් තිබූ බව සඳහන් ග්‍රන්ථයේ නම කුමක්ද ? ........................................................

7. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ බෝකොළ සතරින් පිළිබිඹු කරන අර්ථය කුමක්ද? ..........................................................................

8. කාන්තා රූප පහකින් සම්පිණ්ඩනය කර ඇති සාම්ප්‍රදායික සැරසිල්ල කුමක්ද? ..................................................................................

9. පැදුරු කර්මාන්තයේ දී පතගි දැව සහ කොරකහ කොළ භාවිතයෙන් සාදාගත් වර්ණය කුමක්ද? ................................................

10. ඉන්දීය සාංචි ස්තූපයේ හර්මිකාව නම් අංගය වෙනුවට ලාංකීය ස්තූපවල ඇති අංගය කුමක්ද?.....................................................

- අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

11. වෙස් මුහුණු නිර්මාණය සඳහා පැරණි ශිල්පීන් භාවිතා කර ඇති ද්‍රව වර්ග වන්නේ,

(1) කුඹුක් සහ දිය කදුරු. (2) රුක් අත්තන සහ කොස්.

(3) දිය කදුරු සහ රුක් අත්තන. (4) ගම්මාලු සහ පිහිඹියා.

12. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සෙංකෝලය නිර්මාණය කිරීමේ ගෞරවය හිමි වන්නේ,

(1) ජී.එස් ප්‍රනාන්දු ශිල්පියාටය.. (2) ජෝර්ජ් කීට් ශිල්පියාටය. .

(3) එම්.සාර්ලිස් ශිල්පියාටය. (4) එස්.පී චාර්ල්ස් ශිල්පියාටය.

13. දයා රජපක්ෂගේ සිළුමිණ පත්‍රයේ පළ වූ ප්‍රථම චිත්‍ර කතාව වන්නේ,

(1) "ආදර කෝමා" චිත්‍ර කතාව (2) "ඉන්දු" චිත්‍ර කතාව


(3) "හුලවාලි" චිත්‍ර කතාව (4). "අනුපමා" චිත්‍ර කතාව

14. ක්‍රිම්සන් රතු හා ප්‍රෂියන් නිල් සමව මිශ්‍ර කිරීමෙන් ලැබෙන වර්ණය වන්නේ,


(1) කොළ වර්ණය. . (2) රඹ වර්ණය. .

(3) දම් වර්ණය. . (4) පච්ච වර්ණය.

15. මෙහි දැක්වෙන වීදුරුවේ ඉහළ කොටස සම්පූර්ණ කිරීමට සුදුසු රේඛා සටහන වන්න්නේ,



(1)  (2) 

(3)  (4) 

- අංක 16 සිට 20 තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

16. උද්භිද ගණය :..........................................................................................

..........................................................................................

17. වීරාසන ක්‍රමය :..........................................................................................

..........................................................................................

18. කිරි හිඳවීම :..........................................................................................

..........................................................................................

19. පර්යාවලෝකය :..........................................................................................

..........................................................................................


20. ජනක රත්නායක :..........................................................................................

..........................................................................................


- අංක 21සිට 25 තෙක් දී ඇති රූප සටහන් කොටස්වලට සමීප සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියේ ඇති A,B,C,D,E යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉරි මත ලියන්න.

21.  (,..............)  A

22.  (,..............)  B

23.  (,..............)  C

24.  (,..............)  D

25.  (,..............)  E

- අංක 26 සිට 30 තෙක් දී ඇති වැකිවල හිස්තැනට වඩාත් සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

26. නාට්‍ය ධර්මී සහ ............................................................................ ධර්මී යනුවෙන් ප්‍රධාන නාට්‍ය වර්ග දෙකක් ඇත.

27. වාහල්කඩෙහි පහළින් ඇති කැටයම් තීරු ........................................................... තීරු යනුවෙන් ද හඳුන්වනු ලැබේ.

28. ගැටලුවක් විසඳන අවස්ථාවක් ..................................................................................... මුද්‍රාවෙන් නිරූපණය වන බව ප්‍රකාශවේ.

29. මැදිරිගිරියේ වටදාගෙය ................................................................................... යුගයට අයත් උසස් කලාත්මක නිර්මාණයකි.

30. අනුරාධපුර යුගයට අයත් කලාත්මක කොරවක් ගල ....................................................................................... යේ දක්නට ලැබේ.

- අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන සම්ප්‍රදායික සැරසිල්ල කුමන නමකින් හඳුන්වන්නේ ද? ....................................................................

32. G අක්ෂරයෙන් දැක්වෙන සඳකඩ පහණ කුමන යුගයකට අයත්වේද ? ....................................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන පුවත්පත් චිත්‍ර කතාවේ චිත්‍ර ශිල්පියාගේ නම කුමක්ද ....................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන  චෛත්‍යයේ ඇති ගර්භයේ හැඩය අනුව අයත්වන වර්ගය කුමක්ද? ....................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන මුරගල මධ්‍යයේ ඇති විශාල රුව හඳුන්වන්නේ කුමන නමකින් ද? ....................................................................

- මෙහි දැක්වෙන රූපය හඳුනාගෙන අංක 36 සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් සම්පූර්ණ වාක්‍යය පහක් ලියන්න.



36. කලා කර්මාන්තය පිළිබඳව :....................................................................
....................................................................

37. සැරසිලි කිරීමේ ශිල්ප ක්‍රමය, :....................................................................
....................................................................

38. අමුද්‍රව්‍ය පිළිබඳව :....................................................................
....................................................................

39. ප්‍රචලිත යුගය පිළිබඳව :....................................................................
....................................................................

40. ප්‍රචලිත ප්‍රදේශ පිළිබඳව :....................................................................
....................................................................

( ලකුණු 40)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 09

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- චිත්‍ර කලාව - II - III,

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

**කාලය පැය 2. 30 යි.**

## චිත්‍ර කලාව -II
## රේඛා අධ්‍යයනය හා වර්ණ චිත්‍රය

1. වීදුරුවක් ඇඳ පැන්සලෙන් එළිය අඳුර දක්වන්න. ( ලකුණු 05 )

2 ගස්ලබු ගෙඩියක්, ඇඳ වර්ණ කරන්න. ( ලකුණු 15 )

---

## චිත්‍ර කලාව - III

**"අ" කොටස "ආ" කොටස හෝ "ඉ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.**

**"අ" කොටස - චිත්‍ර සංරචනය.**

1. මුහුදු වෙරළක විනෝදවන පිරිසක්,
2. රිය අනතුරක්,
3. වනයේ සැරිසරන මුව රංචුවක්,
4. බෝ සෙවනේ භාවනාවේ යෙදෙන බැතිමතුන්,

**"ආ" කොටස - මෝස්තර නිර්මාණ.**

5. ළමා ඇද ඇතිරිල්ලකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. අඟල් 7 X 7 ප්‍රමාණයේ කුශන් කවරයකට මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. නවතාවකින් යුතු අලංකාර වෙස් මුහුණක් නිර්මාණය කරන්න.

**"ඉ"කොටස - ග්‍රැපික් චිත්‍ර.**

8. පලතුරු බීම බෝතලයකට සුදුසු ලේබලයක් නිර්මාණය කරන්න.
9. " ළමා කතන්දරයකට " සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
10. " ලාදුරු සුව කළ හැක " තේමාව යටතේ පෝස්ටර් සිතුවමක් නිර්මාණය කරන්න.

( ලකුණු 40 )

2022 අවසාන වාර පරීක්ෂණය
9 ශ්‍රේණිය චිත්‍ර කලාව
I පත්‍රය පිළිතුරු

01. සඳකඩ පහණ
02. පොළොන්නරු
03. පොළොන්නරු වටදාගෙයි
04. අල්ප උන්නත
05. තෘෂ්ණාව/තෘෂ්ණාවේ වෙළීම
06. මණිමේඛලෙයි
07. සතර බ්‍රහ්ම විහරණ
08. පංචනාරි ඝටය
09. රතු වර්ණය
10. හතරැස්කොටුව
11. (3) දිය කඳුරු සහ රුක් අත්තන.
12. (4) එස්.පී ච ාර්ල්ස් ශිල්පියාටය. .
13. (2) "ඉන්දු" චිත්‍ර කතාව
14. (3) දම් වර්ණය.
15. (1)
 (අංක 16 සිට 20 දක්වා දී ඇති වචනයේ අර්ථය පැහැදිලි වනසේ පිළිතුරු ලියා ඇති නම් ලකුණු ලබා දෙන්න.)
16. වෘක්ෂ, ලතා, පුෂ්ප මූලික කරගනිමින් නිර්මාණශිලීව අඳින ලද මෝස්තර ඒකක අයත්වන ගණය.
17. වම්පාදය මත දකුණු පාදය සිටිනසේ වාඩි වී සිටීම.
18. වෙස්මුහුණු කර්මාන්තයේ දී ලීයේ ඇති අධික කිරි ගතිය ඉවත්කර ගැනීම
19. චිත්‍රයක දුර ලඟ දැක්වීම
20. පුවත්පත් චිත්‍රකතා නිර්මාණ ශිල්පියකි.
21. D
22. A
23. B
24. E
25. C
26. ලෝක
27. බොරදම්
28. විතර්ක මුද්‍රාව
29. පොළොන්නරු
30. රත්නප්‍රාසාදයේ
31. යාලි රුව
32. මහනුවර
33. බන්දුල හරිශ්චන්ද්‍ර
34. පද්මාකාර
35. නාරජ රුව
36. ශ්‍රී ලංකාවේ පරම්පරික ලාක්ෂා කලා කර්මාන්තයවේ.
37. නියපොත්ත භාවිතයෙන් සැරසිලි කිරීමේ ශිල්ප ක්‍රමය දැක්වේ.
38.ලාක්ෂා කෘමියාගෙන් ලබා ගන්නා ලාක්ෂා ප්‍රධාන අමුද්‍රව්‍යවේ.
39. මහනුවර යුගයේ දී වඩාත් ප්‍රචලිත විය.
40. මාතලේ හපුවිද / තංගල්ල අඟුල් මඩුව /මහනුවර හුරිකඩුව /බලංගොඩ පල්ලේකන්ද යන ප්‍රදේශ වේ.

# LOL.lk
## BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න



ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. Akura Pilot සමනල දැනුම T සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**